**තනතුරු - අබැර්තු**

**දකුණු පළාත් රාජ්‍ය සේවය - අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**<u>ලියාපදිංචි පදනමෙන් රියදුරු, විදුලි කාර්මික හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් බඳවා ගැනීම.</u>**

දකුණු පළාත් රාජ්‍ය සේවයේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් රියදුරු, විදුලි කාර්මික හා_වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් ලියාපදිංචි පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවන අතර 2026.08.05 දින දහවල් 12.00 තෙක් ලැබෙන අයදුම්පත් පමණක් භාර ගනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | සේවා ගණය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ගෙවන ආකාරය | බඳවා ගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්, අමතර පළපුරුද්ද |
|---|---|---|---|---|---|
| 01 | රියදුරු III ශ්‍රේණිය | ප්‍රාථමික ශිල්පීය | 01 | රා.ප.ච. 10/2025 වැටුප් පරිවර්තන වගුව අනුව PL03 2025 වැටුප් පරිමාණයේ III වන වැටුප් පියවර වන රු.41209.00 (මාසික) පියවර හා රු.17800.00 (මාසික) දීමනාව අනුව දෛනික වැටුප් ගෙවනු ලැබේ. | 1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදි දෙවරකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විෂයන් 06 ක් සමත් වී තිබිය යුතුයි.<br>2. බර වාහන පැදවීම පිළිබඳ ව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.<br>3. මෝටර් රථ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දද ලබා තිබිය යුතුය.<br>4. මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය . |
| 02 | විදුලි කාර්මික III ශ්‍රේණිය | ප්‍රාථමික අර්ධ ශිල්පීය | 01 | රා.ප.ච.10/2025 වැටුප් පරිවර්තන වගුව අනුව PLII 2025 වැටුප් පරිමාණයේ දෙවන උප ලේඛනයේ 1 වන වැටුප් පියවර වන රු.38965.00 (මාසික) පියවර හා රු.17800.00 (මාසික ) දීමනාව අනුව දෛනික වැටුප් ගෙවනු ලැබේ | 1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදි දෙවරකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විශයන් 06 ක් සමත් වී තිබිය යුතුයි.<br>2. විදුලි කාර්මික තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන් හි (N.V.Q.) අවම වශයෙන් දෙවෙනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම.<br>3. අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 03 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 04 | රා.ප.ච. 10/2025 වැටුප් පරිවර්තන වගුව අනුව PL I 2025 වැටුප් පරිමාණයේ තුන්වන උප ලේඛනයේ 1 වන වැටුප් පියවර වන රු. 38,863(මාසික) පියවර හා රු. 17800(මාසික) දීමනාව අනුව දෛනික වැටුප් ගෙවනු ලැබේ. | 1. 8 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම<br>2. තනතුරට අදාළ සේවා පළපුරුද්ද |

1. තනතුරට බඳවා ගැනීමේ ක්‍රමය : සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

2. **බඳවා ගැනීම සඳහා වූ පොදු කොන්දේසි :**

2.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය

2.2 අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව දකුණු පළාත තුළ ස්ථිර පදිංචි කරුවකු විය යුතුය.

.2.3අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිරපදිංචි කරුවන් සඳහා වැඩි ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ

2.4 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

2.5 අයදුම්කරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.6 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

2.7 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට සපුරා තිබිය යුතුය

2.8 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවකු හෝ රාජයේ/ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/ 90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය .

2.9 අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන  අතරතුර කාලසීමාවේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ සංශෝධනය කිරීම අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

**3. සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :**

2026. 12.31 දක්වා කාලයට  පමණක් ලියාපදිංචි කර සේවය ලබා ගැනීම.

**4 . අයදුම් කළ යුතු ආකාරය**

1.1 මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසි වල අයදුම්පත් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාල කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි සඳහන් කර 2026. 08.05 දහවල් 12.00 ටපෙර ලේකම්, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව, බටපොල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

1.2 නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**5.සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික පිටපත් එවිය යුතු වේ.සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය .**

a. උප්පැන්න සහතිකය
b. අධ්‍යාපන  සහතිකය
c. ග්‍රාම නිලධාරි සහතිකය
d. පළපුරුද්ද පිළිබඳ සහතික
e. වලංගු රියදුරු බලපත්‍රය (රියදුරු තනතුර සඳහා අනිවාර්ය වේ.)

2026.07.20 දින
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව, බටපොල

මේජර් ගාමිණී කළුආරච්චි (විශ්‍රාමික),
සභාපති,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.